සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

**7 ශ්‍රේණිය** | **ගණිතය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 2 බැගින් හිමිවේ.

01. පොත් 100 ක මිල රු. 3750.00 විය. එක් පොතක මිල සොයන්න.

02. හිස්තැන් සම්පූර්ණ කරන්න.

$$\frac{5}{4} = \square\frac{\square}{4}$$


03. සුළු කරන්න.

| kg | g | mg |
|---|---|---|
| 3 | 200 | 150 |
| | | x 5 |


04. 0.25 භාගයක් ලෙස දක්වන්න.

Mathematics.lk


05. පහත රූපයෙහි පරිමිතිය සොයන්න.




06. හිස්තැන් සම්පූර්ණ කරන්න.





- පහත දැක්වෙන ත්‍රිකෝණ නිරීක්ෂණය කර ප්‍රශ්න අංක 07 හා 08 සඳහා පිළිතුරු සපයන්න.




07. සමද්විපාද නොවන රූපයෙහි අංකය ලියන්න.


08. සෘජුකෝණී ත්‍රිකෝණයක් වන රූපයෙහි අංකය ලියන්න.

09. එකිනෙකට වෙනස් ලෝහ වර්ග තුනකින් සැදි කම්බි කැබලි 3 ක් එකට සම්බන්ධ කර ඒවායේ දිග $x$ හා $y$ මගින් දැක්වෙන ලෙස පහත රූපයේ සටහන් කර ඇත.





ඒ අනුව කම්බියේ මුළු දිග සඳහා විජීය ප්‍රකාශණයක් $x$ හා $y$ ඇසුරින් ලියන්න.

10. පහත රූපයේ දී ඇති මිනුම් අනුව මුළු රූපයෙහි වර්ගඵලය සොයන්න.




11. $1200ml$ ද්‍රව පරිමාව $l$ වලින් ලියන්න.

12. පහත දැක්වෙන රූප සටහන අනුව වගුවේ දැක්වෙන හිස්තැනට සුදුසු රේඛා ඛණ්ඩය ලියන්න.




| | |
|---|---|
| අරය | |
| විෂ්කම්භය | |

13. සුළු කරන්න.

| $l$ | $ml$ |
|---|---|
| 5 | 300 |
| | x 5 |

14. පියකු සතු මුදලින් $\frac{1}{3}$ පුතාට ද $\frac{3}{5}$ ක් දියණියට ද දුන් විට දෙදෙනාටම දුන් මුදල, මුළු මුදලින් කවර පංගුවක් ද?

Mathematics.lk

15. පැත්තක දිග 5cm වන ඝණකයක පරිමාව සොයන්න.

16. $x=2, y=1$ වන විට, $3x-y$ හි අගය සොයන්න.

17. ආරෝහණ පිළිවෙලට සකසන්න.

$$\frac{3}{10}, \frac{1}{5}, \frac{1}{2}$$

18. අඩු කරන්න.

| m | cm |
|---|---|
| 5 | 20 |
| - 2 | 50 |



19. භාජනයක් තුළ මී පැණි $2l$ ක් අඩංගු වේ. එම මී පැණි ප්‍රමාණය, ධාරිතාව $20ml$ වන කුඩා බෝතල් කොපමණ සංඛ්‍යාවකට පිරවිය හැකිද?

20. සුළු කරන්න. $3\frac{1}{7} + 5\frac{2}{7}$

- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.
(පළමුවන ප්‍රශ්නයට ලකුණු 16 ක්ද අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද ලැබේ.)

---

01. (a) කවකටුව භාවිතා කරමින් පහත දැක්වෙන වෘත්ත රටා අඳින්න.

(i)  (ල.03) (ii)  (ල.03)

(b) (i) අරය 5cm වන වෘත්තයක් ඇඳ එහි කේන්ද්‍රය O ලෙස නම් කරන්න. (ල.02)

(ii) විෂ්කම්භය AB වන පරිදි A හා B එම වෘත්තය මත පිහිටුවන්න. (ල.02)

(iii) OA රේඛාව හඳුන්වන නම කුමක් ද? (ල.02)

(iv) වෘත්තය මත C ලක්ෂ්‍යයක් ලකුණු කර ACB $\Delta$ සම්පූර්ණ කරන්න. (ල.02)

(v) $A\hat{C}B$ අගය මැනීමෙන් එම ත්‍රිකෝණය කවර වර්ගයේ ත්‍රිකෝණයක් දැයි සඳහන් කරන්න. (ල. 02)

---

02. (a) මිනිසකු තමා සතු ඉඩමෙන් $\frac{3}{7}$ පුතාට ද, $\frac{1}{3}$ ඔහුගේ දුවට ද, ඉතිරිය තම බිරිඳට බෙදා දුන්නේ නම්,

(i) දරුවන් දෙදෙනාට හිමිවන මුළු ඉඩම් ප්‍රමාණය මුළු ඉඩමෙන් කවර පංගුවක් ද? (ල.03)

(ii) බිරිඳට හිමිවන ඉඩම් ප්‍රමාණය මුළු ඉඩමෙන් කවර පංගුවක් ද? (ල.02)

(b) සුළු කරන්න.

(i) $5\frac{1}{2} + 1\frac{1}{2} + \frac{5}{8}$ (ල. 04) (ii) $7\frac{1}{10} - 2\frac{3}{5}$ (ල.02)

Mathematics.lk

---

03. (a) සෘජුකෝණාස්‍රයක දිග, පළල ට වඩා 5cm කින් වැඩිය.

(i) සෘජුකෝණාස්‍රයේ පළල $x$ cm ලෙස ගෙන එහි දිග සඳහා වීජීය ප්‍රකාශණයක් ලබාගන්න. (ල.03)

(ii) සෘජුකෝණාස්‍රයේ පරිමිති $x$ ඇසුරින් සොයන්න. (ල.03)


(b) (i) සුළු කරන්න. $6x - 4x + 8x$ (ල.02)

(ii) $x = 2, y = -3$ වනවිට පහත දැක්වෙන ප්‍රකාශණයෙහි අගය සොයන්න.

$5x + 2y$ (ල.03)

---

04. රූප සටහනෙහි දැක්වෙනුයේ එක්තරා වෙළෙඳසැල් ගොඩනැගිල්ලක බිම් සැලැස්මෙහි ආකෘතියකි. කඩ ඉරිවලින් දැක්වෙනුයේ ආරක්ෂිත වැටක් ගොඩනැගිල්ලට සමදුරින් පිහිටන ආකාරයයි.




(i) අඳුරු කළ රූපයේ වර්ගඵලය සොයන්න. (ල.02)

(ii) අඳුරු කළ රූපයේ වර්ගඵලය, අඳුරු නොකළ කොටසේ වර්ගඵලය මෙන් කී ගුණයක් ද? (ල.03)

(iii) ආරක්ෂිත වැටෙහි දිග හා පළල කීයද? (ල.02)

(iv) මෙම ආරක්ෂිත වැටෙහි කම්බි පොටවල් 5 ක් ගැසීමට අවශ්‍ය කම්බි වල දිග ගණනය කරන්න. (සැ.යු. - ගේට්ටුව සඳහා පළල පැත්තෙන් 3m වෙන් කළ යුතුව ඇත.) (ල.04)

05. (a) ඇපල් ගෙඩියක මිල අඹ ගෙඩියක මිලට වඩා රු. 40 කින් වැඩිය.

(i) අඹ ගෙඩිය මිල රු. $x$ ලෙස ගෙන ඇපල් ගෙඩියක මිල සොයන්න. (ල.02)

(ii) අඹ ගෙඩියක් හා ඇපල් ගෙඩියක මිලෙහි එකතුව රු. 80 ක් නම් ඒ සඳහා $x$ ඇසුරින් සමීකරණයක් ගොඩනගා $x$ හි අගය සොයන්න. (ල.04)

(b) පැන්සලක මිල රු. $x$ ද මිලදී ගත් පැන්සල් සංඛ්‍යාව $n$ ද වන විට ඒ සඳහා වැයවන මුදල ද T නම්,

(i) T, $x$, හා $n$ සම්බන්ධ වන ලෙස සූත්‍රයක් ලියන්න. (ල.02)

(ii) $x=5$ සහ $n=8$ නම් T හි අගය සොයන්න. (ල.02)


---

06. (a) එක්තරා දිනකදී කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් වෙත කිරි ගොවීන් 30 දෙනෙකු විසින් ගෙන එන ලද කිරි ප්‍රමාණයන් පහත සටහනෙහි දක්වේ.


| කිරි ගොවීන් සංඛ්‍යාව | ගෙන එන ලද කිරි ප්‍රමාණය |
|---|---|
| 12 | $4l$ |
| 8 | $3l\ 750ml$ |
| 5 | $8l$ |
| 5 | $2l\ 400ml$ |

(i) කිරි ගොවීන් 30 දෙනා විසින් ගෙන එන ලද මුළු කිරි ප්‍රමාණය සොයන්න. (ල.07)

(b)




1 රූපය




2 රූපය

(i) ඉහත දක්වෙන ඝණකාභයන්හි පරිමාව වෙන වෙනම සොයන්න. (ල.02)

(ii) එම ඝනකාභවල පරිමාවන් පිළිබඳව ඔබගේ නිගමනය කුමක් ද? (ල.02)

Mathematics.lk

---

07. (a) එක්තරා පොත් වෙළඳ සැලක ප්‍රදර්ශනය කර තිබූ මිළ දර්ශණයකින් කොටසක් පහත දක්වේ.

| වර්ගය | ඒකක මිළ රු. |
|---|---|
| පිටු 40 අභ්‍යාස පොත | 32.50 |
| පිටු 120 අභ්‍යාස පොත | 53.25 |
| ජෙල් වර්ගයේ පෑන | 13.00 |
| සාමාන්‍ය පෑන | 9.80 |

මෙම වෙළඳ සැලෙහි එක් පාරිභෝගිකයකු විසින් මිළයට ගත් ද්‍රව්‍ය පහත පරිදිය.

පිටු 40 අභ්‍යාස පොත් 10
පිටු 120 අභ්‍යාස පොත් 05
ජෙල් වර්ගයේ පෑන් 02
සාමාන්‍ය වර්ගයේ පෑන් 03

මෙම පාරිභෝගිකයා වෙළඳ සැල වෙත ගෙවන මුළු මුදල ගණනය කරන්න. (ල.05)

(b) (i) $\frac{2}{5}$ දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න. (ල.02)

(ii) සුළු කරන්න.

$5.6 \div 4$ (ල.02)

$6.023 \times 100$ (ල.01)